වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම් කිරීම සඳහා අතිරේක මූල්‍ය ව්‍යාපෘතිය - 2018.

-----------------------------------------------------------------------------------------------------

වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම් කිරීම සඳහා අතිරේක මූල්‍යයනය ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2014 සැප්තැම්බර් 12 දින එළඹි ණය ගිවිසුම් අංක 5445(එල්කේ) දරණ ණය ගිවිසුමේ සාමාන්‍ය කොන්දේසිවල 4.09 (ආ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්තික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කල යුතු යැයි මා සලකන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘතියේ කාල සීමාව

-----------------------------------------------------------------------------------------------

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ජාතික ජල සම්පාදන හා ජලා ප්‍රවාහන මණ්ඩලය , ජල සම්පත් මණ්ඩලය පළාත් සභා සහ ලංකා විදුලිබල මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණු වන්නේ විශාල වේලි මෙහෙයුම් හා නඩත්තු කිරීම සඳහා දිගුකාලීන තිරසාර වැඩපිළිවෙලක් ස්ථාපිත කිරීම සහ ජල සම්පත් සැලසුම් කාර්යය වැඩිදියුණු කිරීමයි. මූල්‍ය ගිවිසුම් අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 11, 154 කට සමාන එ.ජ.ඩො. මිලියන 84.50 ක් වන අතර, ඉන් රු.මිලියන 10, 956 කට සමාන එ.ජ.ඩො. 83 ක් සැපයීම සඳහා ජාත්‍යන්තර සංවර්ධන සංගමය එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2014 ඔක්තෝබර් 23 දින ආරම්භ කරන ලද අතර 2018 මැයි 15 වන විට නිමකිරීමට නියමිතය. කෙසේ වෙතත් ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් නිම කිරීමේ කාලය 2018 සැප්තැම්බර් 15 දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 තත්ත්වාගණනය කල මතය

---------------------------------

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කල මතය සඳහා පදනම කොටසේ 2.1 ඡේදයේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයන් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

---------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

----------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ව්‍යාපෘතිය අඛණ්ඩව පවත්වාගෙනයාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර කළමනාකාරීත්වය ව්‍යාපෘතිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ව්‍යාපෘති අඛණ්ඩ පැවැත්මට අදාල කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

ව්‍යාපෘතිය විසින් වාර්ෂිකව හා වරින් වර මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා ව්‍යාපෘතියේ ආදායම්, වියදම්, වත්කම් සහ වගකීම් පිළිබඳ නිසි පොත් හා වාර්තා පවත්වා ගැනිම අවශ්‍ය වේ.

ව්‍යාපෘතියේ  මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

----------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි  නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර  ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

## 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| | ගිණුම්කරණ අඩුපාඩු / විගණන නිරීක්ෂණ | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතියේ කටයුතු 2018 සැප්තැම්බර් 15 දින වන විට අවසන් කර තිබුණද, ව්‍යාපෘතියේ මෙහෙයුම් සීමා කිරීම සඳහා ණය ගිවිසුම මගින් පනවා ඇති සීමාවන් සැලකිල්ලට නොගෙන 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම පදනම මත සකස්කර තිබුණි. | ගිණුම්කරණ ප්‍රතිපත්ති වැරදි ලෙස අනුගමනය කිරීම. | යෝජිත ජලාශ හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතියට සීමිත කාර්ය මණ්ඩලයක් හා වත්කම් යොදා ගැනීමට රේඛීය අමාත්‍යාංශයේ ලේකම් තීරණය කර තිබුණි. | ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමට හා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට කටයුතු කල යුතුය. |
| (ආ) | ව්‍යාපෘති සැලැස්ම තුල රු. මිලියන 4.37 ක් පිරිවැය වූ උපකරණ හා අනෙකුත් වත්කම් 160 ප්‍රසම්පාදනයේදී කොන්ත්‍රාත්කරුවන්ගේ ක්‍රියාකාරකම් හරහා මිලදී ගැනීමේදි එම වත්කම්වල ප්‍රයෝජනවත් ජීවිත කාලය සැලකිල්ලට නොගෙන ව්‍යාපෘතියේ කළමනාකරණ වියදම් යටතේ දක්වා තිබුණි. | ගිණුම්කරණ වැරදි ලෙස භාවිතා කිරීම. | අදහස් දක්වා නැත. | ව්‍යාපෘතිය මූල්‍ය ප්‍රකාශනවල ව්‍යාපෘතියේ වත්කම් ප්‍රයෝජනවත් ජීවිත කාලය පදනම් කරගන්නා ආකාරය ගිණුම් ප්‍රතිපත්ති මඟින් අනාවරණය කල යුතුය. |
| (ඇ) | ව්‍යාපෘතිය විසින් මිලදී ගන්නා ලද දේපළ පිරියත හා උපකරණ වල පිරිවැය රු. මිලියන 959.60 ක්වූ අතර මූල්‍ය ප්‍රකාශනවල ඊට අනුරූපී පිරිවැය එකතුව රු. මිලියන 829.62 ක් ලෙස දක්වා තිබීමෙන් ව්‍යාපෘතියේ ස්ථාවර වත්කම් ලේඛණය සමග එකග නොවුණි. | ශේෂයන් නොසැසඳීම | අදහස් දක්වා නැත. | මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති තොරතුරු අනුරූපී වාර්තා සමග එකඟ විය යුතුය. |

**3.** **භෞතික ප්‍රගතිය**

**3.1** **කොන්ත්‍රාත් පරිපාලනය**

| විගණන නිරීක්ෂණ | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිරීක්ෂණ |
| --- | --- | --- | --- |
| (අ) 2015 ජුනි 30 දින දක්වා ක්‍රියාත්මක කරන ලද වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම් ව්‍යාපෘතිය නමින් හැඳින්වෙන පෙර ව්‍යාපෘතිය අවසන් කරන විට සම්පූර්ණ කර නොතිබූ වේලි කිහිපයක පිළිසකර හා වෙනත් කටයුතු මෙම ව්‍යාපෘතියට මාරුකර තිබුණි. ලබා දී ඇති තොරතුරු වලට අනුව මෙම ව්‍යාපෘතියේ කාලපරිච්ඡේදය අවසානයේද අදාල වැඩ අවසන් කර නොතිබුණි. | ව්‍යාපෘතියේ අපේක්ෂිත කාර්යය සම්පූර්ණ කරගත නොහැකි වී තිබීම. | අදහස් දක්වා නැත. | විදේශ ණයවලින් ලැබෙන මුදල් ඵලදායි ලෙස උපයෝජනය කර ගැනීම සඳහා ව්‍යාපෘතිය ආරම්භක අවධියේදීම එවැනි හදිසි අවශ්‍යතා හඳුනා ගැනිම අවශ්‍ය වන අතර අනාගත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී මෙම අත්දැකීම් යොදාගත යුතුය. |
| (i) පොල්ගොල්ල උමගෙහි පිළිසකර වැඩ සඳහා අවශ්‍යතා හඳුනා ගැනිමට පර්යේෂණ කටයුතු කිරීම. | | ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් ජල මුදාහරින දිනයන් තීරණය නොකිරීම නිසා පොල්ගොල්ල උමගෙහි පරීක්ෂාවන් සිදුකර නොතිබුණි. තවද මෙම ක්‍රියාකාරකම් ව්‍යාපෘතියේ විෂය පථයෙන් ඉවත්කරගෙන තිබුණි. | |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | ක්‍රියාත්මක කිරීමේ නියෝජිත ආයතන සඳහා සොරොව් බැරල් පරීක්ෂා කිරීමේ උපකරණ මිලදී ගැනීම. | | සොරොව් බැරල් පරීක්ෂා කිරීමේ උපකරණ මිලදී ගැනීමේදී ක්‍රියාත්මක කිරීමේ ආයතනය විසින් පිරිවිතර ඉදිරිපත් කර නොතිබුණි. | |
| (iii) | වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ භූ විද්‍යාත්මක පර්යේෂණ මධ්‍යස්ථානය වැඩි දියුණු කිරීම. | | ඉඩම් ලබා ගැනීමේ ගැටළු හේතුවෙන් භූ විද්‍යාත්මක පර්යේෂණ මධ්‍යස්ථානයේ වැඩිදියුණු කිරීමේ කටයුතු විෂය පථයෙන් ඉවත් කර තිබුණි. | |
| (ආ) | මෙම ව්‍යාපෘතිය යටතේ ජාතික ජල පරිහරණ සැලැස්ම යාවත්කාලීන කරන ලද මහවැලි ජල සම්පත් සැලැස්ම සඳහා පෙර ව්‍යාපෘතිය විසින් සකස් කරන ලද ශක්‍යතා අධ්‍යන කෙටුම්පත් වාර්තා මත පදනම්ව රු. මිලියන 516.821 ක් වියදම් කර තිබුණද එය සම්පූර්ණ කර නොතිබුණි. | ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිලාභ ලගාකර නොගැනීම. | සංරචකයන් යටතේ හඳුනාගෙන තිබුණු ශක්‍යතා අධ්‍යනය වෙනත් ව්‍යාපෘතියන් යටතේ සිදුකිරීම හේතුවෙන් නැවත සිදුකිරීම වලක්වා එය ඉවත්කර තිබුණි. | මුල් අවධියේම ව්‍යාපෘතියේ අරමුණු හඳුනා ගැනීම අත්‍යවශ්‍ය වේ. |
| (ඇ) | බාහිර පාර්ශවයන්ට ලබා දී තිබුණු රුපියල් මිලියන 20.81 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම්, ක්‍රියාත්මක කරන ලද ආයතනවලට ලබා දී ඇති රු. මිලියන 2.94 වෙනත් අත්තිකාරම් හා බාහිර පාර්ශවයන්ට ගෙවිය යුතු නිරවුල් නොකරන ලද රු. මිලියන 32.56 ක රඳවා ගත් මුදල් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ව්‍යාපෘති කාලපරිච්ඡේදය අවසන් වී තිබුණද හඳුනා නොගත් ශේෂය පැවතීම. | සියලුම කොන්ත්‍රාත් ගෙවීම් පියවා තිබුණි. | ක්‍රියාත්මක කිරීමේ ආයතන විසින් අත්තිකාරම් ශේෂ අයකර ගැනීමට පියවර ගත යුතුය. |
| (ඈ) | ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ පොල්ගොල්ල ජලාශ කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා නව ගොඩනැගිල්ලක් | නාස්තිකාර වියදම් | මධ්‍යම පරිසර අධිකාරිය විසින් දැනට පවත්නා ගොඩනැගිල්ල මහවැලි අධිකාරියට | අදාල සංවිධාන සමඟ සාකච්ඡා කිරීමට නොපමාව පියවර ගත යුතුය. |

| | |
|---|---|
| සහ දැනට පවතින ගොඩනැගිල්ලේ අලුත්වැඩියා කිරීම සඳහා රු. මිලියන 262.09 ක ඇස්තමේන්තු පිරිවැයකට 2016 නොවැම්බර් 24 දින කොන්ත්‍රාත්තුවක් පිරිනමා තිබුණි. කෙසේවෙතත් දැනට පවතින ගොඩනැගිල්ලේ ප්‍රතිසංස්කරණ කටයුතු අත්හිටුවා ඇති අතර නව ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා රු. මිලියන 259.15 ක් වියදම් කර ඒ සඳහා කරන ලද අමතර වැඩවලට අනුමැතිය ලබා දී තිබුණි. | භාර නොදීම හේතුවෙන් ගොඩනැගිල්ලේ ප්‍රතිසංස්කරණ කටයුතු ක්‍රියාත්මක කර නොතිබුණි. |

3.2 ඌන උපයෝජිත වත්කම්

-----------------------------

| විගණන නිරීක්ෂණ | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිරීක්ෂණ |
|---|---|---|---|
| --------------------- | --------- | -------------------- | -------------- |
| කොත්මලේ පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීමේ කටයුතු රු. මිලියන 132.84 ක් වැයකර සැලකිය යුතු ලෙස අවසන් කර 2018 මැයි මාසයේදී ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට භාර දී තිබුණි. කෙසේ වෙතත් පුහුණු මධ්‍යස්ථාන පුහුණු කටයුතු සඳහා 2018 දෙසැම්බර් 31 දින වන විටත් භාවිතාකර නොතිබුණු අතර මිලදී ගන්නා ලද රු. මිලියන 9.91 ක් පිරිවැය වූ ගෘහභාණ්ඩ හා සවිකිරීම් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් මාස 7 ක් නිෂ්ක්‍රීයව පැවතුණි. | ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ලඟාකර ගැනීමට නොහැකි විම. | 2018 මැයි මාසයේදී අඩු පාඩු කිහිපයක් හඳුනාගෙන ඇති අතර හඳුනාගත් අඩුපාඩු නිවැරදි කිරීම සඳහා කොන්ත්‍රාත්කරු කටයුතුකරමින් තිබුණි. | අඩුපාඩු කල් ඇතිව නිවැරදි කිරීම සහ සම්පත් අපේක්ෂිත අරමුණු සඳහා භාවිතා කිරීමට පියවර ගත යුතුය. |